# මූලික අයිතිවාසිකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

කේ.එම්.ඩී.සී ප්‍රසාදි*

**සංක්ෂේපය**

මූලික අයිතිවාසිකම් යනු එක් එක් රාජ්‍ය විසින් මානව අයිතිවාසිකම් සමූහය අතරින් අත්‍යවශ්‍යයෙන්ම රැකිය යුතු යැයි තමන් පිළිගන්නා අයිතිවාසිකම් ය. ලෝකය තුළ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේදී ඇතිවන විෂමතා ගණනාවක් දක්නට ලැබේ. ලෝකයේ රටවල් අතරින් බොහෝමයක් රටවල මූලික අයිතිවාසිකම් සුරක්ෂිත වීමක් දැකිය හැකිය. නමුත් සමහර රටවල මූලික අයිතිවාසිකම් දැඩි වශයෙන් උල්ලංඝණයවීම දැකිය හැකිය. මෙසේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණයවන බොහෝ රටවල එම අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින්ම පියවර ගෙන තිබේ. ඒවා කඩවීමකදී ගතයුතු පියවර ද සඳහන්ව පවතී. මෙම ලිපියෙහි අරමුණ වන්නේ බ්‍රිතාන්‍යය, ඉන්දියාව සහ ටැන්සානියාව රටවල පරිපාලන තත්ත්වයට අනුව එම රටවල කොතෙක් දුරට මූලික අයිතිවාසිකම් සුරැකී තිබේදැයි අනාවරණය කරගත හැකිද යන්න සොයාබැලීමයි.

**හැඳින්වීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටක මූලික නීතිය හෙවත් මුඛ්‍ය නීතිය වෙයි. එය සරල ලෙස අර්ථකථනය කර දක්වන්නේ නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටක ප්‍රධාන නීතිය වේ. එනම් රටක පවතින්නා වූ සෙසු නීති එයට යටත් වන අතරම එම නීති සම්පාදනය විය යුත්තේ ද රටක මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව සහ එයට අනුකූලවන පරිද්දෙනි. තවත් සරලම ආකාරයට දක්වන්නේ නම් රටක පාලන කටයුතු මෙහෙයවීම සඳහා පවතින නෛතික ලේඛනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව රාජ්‍යයන් තුළ පාලන කටයුතු සිදුවන්නේ නම් එම රාජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී භාවයෙන් අනූන වූ රාජ්‍යයක් බවට ජාත්‍යන්තරය තුළ පිළිගැනීමකට ලක්වේ.රාජ්‍යයක් තුළ පුරවැසියන්ගේ ජීවිතය යහපත් අයුරින් ගොඩනැංවීම රාජ්‍යය සතු ප්‍රධානතම වගකීම වන අතර එය නිසිපරිදි ඉටුවීමට නම් එම රාජ්‍යය තුළ යහපාලනයක් පැවතිය යුතුවේ. එම යහපාලනය ළඟාකර ගතහැකි වන්නේ රාජ්‍යයක් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව පාලන කටයුතු සිදුවන්නේ නම් පමණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යන්නට එසේ සරලව අර්ථකථනය කරනු ලැබුව ද මේ සම්බන්ධයෙන් ඉදිරිපත්වී ඇති පොදු නිර්වචනයක් නොමැත.

''ඇරිස්ටෝටල් නැමැති දේශපාලන චින්තකයාට අනුව රාජ්‍ය තුළ වාසයකරන පුරවැසියන් අතර පැවතිය යුතු සබඳතාවයන්ගේ ස්වරූපය විධිමත්ව දක්වන ලේඛනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ'' (සොයිසා, 1993).

* *තාවකාලික කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, prasahas@gmail.com*

''ඩයිසිට අනුව රාජ්‍යයේ ස්වාධිපති බලය බෙදාහැරීම විදහා දක්වන සියලුම ආකාරයේ සෘජු හා වක්‍ර නීති අඩංගු ලියවිලි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලෙස නම් කළ හැකි ය''(සොයිසා, 1993).

''හර්මන් ෆයිනර් නැමැති දේශපාලන චින්තකයා දක්වන ආකාරයට ආණ්ඩුවේ දේශපාලන ආයතනයන්ගේ පදනම විස්තර කරන ලේඛනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ'' (හිග්ගොඩ, 1992).

''බොල්ඩ්වින්ග් බෲක් පෙන්වාදෙන ආකාරයට පොදු යහපත උදෙසා බුද්ධිය යොදවා සකස් කරන ලද නීති සහ සමාජ සම්ප්‍රදායන්ගෙන් සමන්විත ලියවිල්ල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වේ'' (සොයිසා,1993).

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්ද යන්න සම්බන්ධයෙන් විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇති අතර එම නිර්වචන එකිනෙකට වෙනස් ස්වරූපයක් ගනු ලබයි. මෙහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු කුමක්ද යන්න නිශ්චිත පොදු නිර්වචනයක් ඉදිරිපත්කළ නොහැකිබව හඳුනාගතහැකි විශේෂ ලක්ෂණයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් තිබිය යුතු අනිවාර්ය ලක්ෂණ කිහිපයක් පවතී. ඒ අතුරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නීතිය හා සමාජය විසින් පිළිගත් උත්තරීතර ලෙස සලකනු ලබන සම්ප්‍රදායන් තුළ අන්තර්ගත වී සකස්විය යුතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සරල හා නිරවුල් භාෂාවකින් ලේඛනගත කිරීම ද අනිවාර්ය අංගයක් වේ. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පරිපූර්ණ එකක් වියයුතු මෙන්ම හැකිතරම් කෙටිවිය යුතු ය. එමගින් අවධාරණය කරනු ලබන ප්‍රධාන කාරණාව නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ අවශ්‍යම සහ වැදගත් කරුණු පමණක් අන්තර්ගත විය යුතු බවයි. මෙකී ලක්ෂණවලින් සමන්විත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු අංග ලක්ෂණයක් වනුයේ රාජ්‍යය විසින් පුරවැසියන්ට ප්‍රදානය කරනු ලබන මූලික අයිතිවාසිකම් පිළිබඳ ලේඛනයක් අන්තර්ගතකර තිබීමයි. එය ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්ව තිබෙන්නා වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ අනිවාර්ය අංග ලක්ෂණයක් ලෙස ද සඳහන්ව පවතී. එහිදී මූලික අයිතිවාසිකම් පැහැදිලි සහ නිරවුල්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අන්තර්ගත වියයුතු අතර මූලික අයිතිවාසිකම් කඩ වූ විටෙක පුරවැසියන්ට සහන ලබා ගතහැකි ආකාරය ද දැක්විය යුතුම වූ ලක්ෂණයකි.

මේ ආකාරයේ අංග ලක්ෂණවලින් සමන්විත වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ ආණ්ඩුවේ ආයතනික ව්‍යුහය, ආණ්ඩුවේ මූලික ආයතනවල ස්වභාවය, එම ආයතනවලට හිමි කාර්ය ක්ෂේත්‍රය, බලතල සහ ආයතනික සබඳතාවයන්හි ස්වරූපය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යම් ආකාරයකින් සංශෝධනය කරන්නේ නම් එම සංශෝධනය කිරීමේ විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ අඩංගු විය යුතු බව පොදු පිළිගැනීමයි.මෙකී ලක්ෂණවලින් සමන්විත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රධාන ලෙස තුන් ආකාරයකට වර්ගීකරණය කළහැකි ය. එනම් ලිඛිත - අලිඛිත, නම්‍ය - අනම්‍ය, ඒකීය සන්ධීය වේ

ඉහත සඳහන් ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වර්ගීකරණයට ලක්ව ඇති අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව පාලනයවීම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක අත්‍යවශ්‍යම භූමිකාව

බවට පත්වතිබේ. ඕනෑම රාජ්‍යයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව පාලනයවීම මත එම රාජ්‍ය තුළ ජීවත්වන මහජනතාවට සිය පාලකයාගේ අත්තනෝමතික හා හිතුවක්කාරී ලෙස කටයුතුකිරීම වළක්වා ගත හැකිවීම මෙහිදී දක්නට ලැබෙන තවත් වාසිදායක ගුණාංගයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව කෙරෙන පාලනයක් තුළදී පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමට හැකිවීමත්, එමෙන්ම රාජ්‍යය තුළ ජීවත්වන බහුවිධ සමාජය තුළ සෑම ජන කොටසකගේම අයිතිවාසිකම් ආරක්ෂාකර ගනිමින් පොදු ජාතිකත්වයක් ගොඩනගා ගැනීමට ද හැකියාව ලැබේ.

එසේ ලෝකයේ රාජ්‍යයන් පුරා ව්‍යාප්ත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්හි අවශ්‍යයෙන්ම තිබිය යුතු අංග ලක්ෂණයක් ලෙස රාජ්‍යය විසින් පුරවැසියන්ට ප්‍රදානය කරනු ලබන මූලික අයිතිවාසිකම් පිළිබඳ ලැයිස්තුවක් අන්තර්ගතකර තිබීම පෙන්වාදිය හැක. එපමණක් නොව එම අයිතිවාසිකම් පැහැදිලිව හා නිරවුල්ව දැක්විය යුතුඅතර මූලික අයිතිවාසිකම් කඩවූ විටෙක පුරවැසියන්ට සහන ලබාගත හැකි ආකාරය ද දැක්විය යුතුම වේ. මේ ආකාරයට රාජ්‍ය විසින් ප්‍රධාන තැනක් හිමිකර දෙන්නා වූ මූලික අයිතිවාසිකම් වර්ධනයවීමට පසුබිම සලසාලනු ලබන්නේ මානව අයිතිවාසිකම් හරහා ය.

**අයිතිවාසිකම්**

අයිතිවාසිකම් යනු ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක වැදගත් කොන්දේසියක් ලෙස සලකනු ලැබේ. වර්තමානයේ ලෝකයේ බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යවල අයිතිවාසිකම් යන්න ඉතා වැදගත් මාතෘකාවක් බවට පත්ව තිබේ. මිනිසාට පරිපූර්ණ ජීවිතයක් ගතකිරීම උදෙසා අයිතිවාසිකම් අත්‍යවශ්‍ය වේ. ඒ අනුව මිනිසාට සමාජගත ජීවිතයක් සාර්ථක අයුරින් පවත්වාගෙන යාමට අවශ්‍ය වැදගත් සංකල්පයක් ලෙස අයිතිවාසිකම් තවදුරටත් හඳුන්වාදිය හැකිය. ඒ අනුව වර්තමානයේ වෙන කවරදාකටත් වඩා ජාත්‍යන්තර ප්‍රජාව අයිතිවාසිකම් පිළිබඳව සැලකිල්ල යොමුකර තිබේ. අයිතිවාසිකම් සමාජය බිහිවීමටත් පෙර සිටම ජනතාව සතුවී තිබුණි. එම අයිතිවාසිකම් ජනතාවට හිමිවූයේ මිනිසා සමාජයේ ජීවත්වන බැවිනි. සමාජය බිහිවී ඇත්තේ ද මෙම අයිතිවාසිකම් රැකීම සඳහා ය. මෙම අයිතිවාසිකම්වල කිසියම් පරමාර්ථයක් ඇත. මිනිසාගේ පෞද්ගලිකත්වය සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය රටාව එමඟින් සැකසේ. එනමුත් අයිතිවාසිකම් යන්න හඳුනාගැනීම සඳහා නිශ්චිතව ඉදිරිපත් වූ නිර්වචනයක් හඳුනාගැනීම අපහසු ය. එහෙයින් අයිතිවාසිකම් යන්න විවිධ චින්තකයන්ගේ විවිධ නිර්වචනවලට බඳුන්ව ඇත.

''මහාචාර්ය විශ්වා වර්ණපාල මහතා අයිතිවාසිකම් යන්න හඳුන්වා ඇත්තේ මිනිසාගේ පෞද්ගලිකත්වය පරිපූර්ණ කරගැනීමට තිබියයුතු රටාව ලෙස ය'' (හිග්ගොඩ, 1992).

''හොබ්ස් හවුස් නැමැති චින්තකයා ප්‍රකාශ කරන්නේ යහපත් සමාජගත ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය අන්‍යයන් අපගෙනුත් අප අන්‍යන්ගෙනුත් අපේක්ෂා කරන්නා වූ සමාජ ඉඩප්‍රස්තාව අයිතිවාසිකම් වේ'' (සුචේතනා, 2010).

''ලැස්කි පෙන්වා දෙන ආකාරයට අයිතිවාසිකම් යනු මිනිසාට තම සමාජ ජීවිතය යහපත් අයුරින් පවත්වාගෙන යාමට අවශ්‍ය කොන්දේසි වේ''(සොයිසා, 1993 ).

''තෝමස් හොබ්ස් ප්‍රකාශ කරන්නේ මිනිසාට ස්වභාවයෙන්ම සෑමදෙයක් සම්බන්ධයෙන්ම අයිතිවාසිකමක් පවතින බවයි'' (හිග්ගොඩ, 1992).

නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පුරවැසියාට අයිතිවාසිකම් ලබාදිය යුතු වේ. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක කේන්ද්‍රස්ථානය පුද්ගලයා වීම ඊට හේතුවයි. වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් පුද්ගල එකතුවකින් සකස් වී ඇත. එබැවින් මිනිසාට තම පෞරුෂත්වය වැඩි දියුණු කරගැනීමට අවශ්‍ය කොන්දේසි අයිතිවාසිකම් ලෙස තවදුරටත් නිර්වචනය කළහැකිය. ඕනෑම රාජ්‍යයක් කෙබඳු රාජ්‍යයක් දැයි හඳුනාගත හැක්කේ එම රාජ්‍යය ජනතාවට ලබා දී ඇති අයිතිවාසිකම් ප්‍රමාණය අනුව ය. ''රාජ්‍යය කොටින්ම අයිතිවාසිකම් මවන්නෙක් නොවේ. අයිතිවාසිකම් පිළිගන්නෙකි". කිසියම් කාල පරිච්ඡේදක දී රාජ්‍යයේ පිළිගැනීමට භාජනයවන අයිතිවාසිකම් අනුව රාජ්‍යයේ ස්වභාවය ප්‍රකාශිත වන්නේය''(ලැක්සි,1964). අයිතිවාසිකම් සෑම රාජ්‍යයක් තුළම සුරක්ෂිත නොවේ.ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රටවල අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළ අන්තර්ගත කර ඇති බැවින් ඒවා දැඩි ලෙස ක්‍රියාත්මකවීමට පසුබිම සකස් වී ඇත. එමෙන්ම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ඇතුළත්කර ඇත.

අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ අන් අයගේ අයිතිවාසිකම්වලට හානියක් නොවන පරිදිය. අයිතිවාසිකම් භුක්ති විඳීමේදී සමාජයට හානිකර අයුරින් හැසිරීමට කිසිවෙකුටත් අයිතියක් නොමැත. එමෙන්ම අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ පොදු සමාජ යහපත පදනම් කරගෙන ය. මිනිස් ජීවිත මානුෂීය ගුණාංගයන්ගෙන් යුතුව පවත්වාගෙන යාමට අයිතිවාසිකම් උපකාරී වේ. සමාජ සත්වයෙකු ලෙස මිනිසාට අභිමානයෙන් යුතුව තම පෞරුෂත්වය, පුද්ගලිකත්වය ගොඩනගා ගනිමින් ජීවිතය ගතකිරීමට අයිතිවාසිකම් අවශ්‍යවේ.

**මානව අයිතිවාසිකම්**

අයිතිවාසිකම් වර්ගීකරණය තුළ මානව අයිතිවාසිකම්වලට හිමිවන්නේ ප්‍රමුඛතාවයකි. මානව අයිතිවාසිකම් පිළිබඳ ලෝක ඉතිහාසය හා වර්ධනය පිළිබඳව සලකා බැලීමේදී, මානව අයිතිවාසිකම් යනු මනුෂ්‍යාට උරුම වන්නා වූ අත්‍යවශ්‍ය මූලික හා ස්වභාවික අයිතිවාසිකම් සමූහයක් ලෙස සරලව අර්ථ දැක්විය හැකිය. මානව අයිතිවාසිකම්වල ඉතිහාසය මානවයාගේ ඉතිහාසය තරම්ම පැරණි වේ. මානවයා ශිෂ්ට සම්පන්න මිනිසෙකු වූයේ කවදා දැයි මේ වනතුරු නිශ්චිත නිගමනයකට පැමිණීමට ගවේශකයන් සමත්ව නැත. නමුත් නොදියුණු යුගයේ මානවයා අශිෂ්ටව වෙනත් සත්ත්වයන්ට සමාන ලෙස තවත් එක් සත්ත්වයෙකු ලෙස ජීවත්ව, ක්‍රමයෙන් මානවයාගේ මනස පරිනාමයට පත් වී බුද්ධිය වර්ධනය වීමෙන් ශිෂ්ට මිනිසෙකු බවට පරිවර්තනය විය. මානව සංහතියේ සංවර්ධනයත් සමඟ මිනිසා සංකීර්ණ අක්ෂර වචන සහිත නූතන මානව භාෂාව නිර්මාණය කරගෙන

ඇත. මානව භාෂාව නිසා මිනිසාට සමාජය සමඟ අදහස් හුවමාරු කරගැනීමට හැකිවීමෙන් මිනිසා සමාජශීලියෙකු බවට පත්විය. මේ නිසාම මිනිසාට සංස්කෘතියක් හිමි වූ අතරම එමඟින් සමාජ ගත කණ්ඩායම් වීමේ හැකියාව ද ලැබුණි. එසේම හෘද සාක්ෂියට අයිතියක් ලැබී සමාජය තුළ අනායයන් හා සමානව සැලකුම් ලැබීමටත් කෲර සහ අවමන් සහගත සැලකීම්වලට භාජනය නොවීමටත්, ජීවත්වීමේ අයිතියටත් යනාදී වශයෙන් ස්වභාවික අයිතිවාසිකම් රැසකට වර්තමානයේදී මිනිසා හිමිකම් ලබාසිටී.

## මූලික අයිතිවාසිකම්

මූලික නීතිය හෙවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යටතට අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයක් ඇතුළත් කිරීම නූතන ව්‍යවස්ථා තුළ දැකගත හැකි ලක්ෂණයකි. ප්‍රජාතන්ත්‍රවාදයේ එක් උපායක් ලෙස ද ආණ්ඩුක්‍රම සම්පාදකයන් මෙම අයිතිවාසිකම් හඳුනාගෙන හමාර ය. එනම් මූලික අයිතිවාසිකම් යනු එක් එක් රාජ්‍යයන් විසින් මානව අයිතිවාසිකම් සමූහය අතරින් අත්‍යාවශ්‍යයෙන්ම රැකිය යුතුයැයි තමන් පිළිගන්නා අයිතිවාසිකම් පිළිගෙන ඒ ඒ රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට ඇතුළත්කර ඇති නෛතික සහ ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදන වේ. මෙයින් පැහැදිලි වන කරුණක් වන්නේ සෑම රටකම පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් එක හා සමාන නොවන බවයි. එමෙන්ම පරමාදර්ශ මානව අයිතිවාසිකම්වලින් කොටසක් ක්‍රමිකව විකාශනය වූ කාර්ය පටිපාටි තුළින් මූලික අයිතිවාසිකම් බවට පත්වී ඇත. මානව අයිතිවාසිකම් ලෝකයේ ඕනෑම තැනක සිටින මිනිසුන්ට එක හා සමානව හිමි වේ. එහෙත් මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් මෙය අදාළ නොවේ. එක් රටක් පිළිගන්නා මූලික අයිතිවාසිකමක් තවත් රටක් විසින් පිළිනොගන්නා ස්වභාවයක්ද පවතී. ජීවිතයට ඇති අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස ඇමරිකාවේ සහ ඉන්දියාවේ පිළිගෙන ඇති නමුත් ශ්‍රී ලංකාවේ පිළිගෙන නොමැත. මානව අයිතිවාසිකම් නොබෙදිය හැකි සංකල්පයකි. නමුත් මූලික අයිතිවාසිකමක් එසේ නොවේ. ඒ අනුව විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය පිළිගත් බොහෝ රටවල් තම රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ස්වරූපය හා තත්ත්වය සැලකිල්ලට ගෙන යම් අයිතිවාසිකම් ප්‍රමාණයක් ආරක්ෂා කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරගන්නා ලදී. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත්කර එයට මූලිකත්වයදීම හේතුවෙන් ඒවා මූලික අයිතිවාසිකම් ලෙස හැඳින්වේ. මූලික අයිතිවාසිකම් ඇතුළත්කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතරට ඇමරිකාව, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව වැනි රටවල් පෙන්වා දියහැක. නූතනයේ සෑම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක මූලික අයිතිවාසිකම් පිළිබඳව වෙන් වෙන්ව පරිච්ඡේද අන්තර්ගතකර තිබේ. එක් එක් රටවල දේශපාලන ආර්ථික පසුබිම සාමාජීය අවශ්‍යතාවය අනුව ව්‍යවස්ථාවට මෙසේ අයිතිවාසිකම් ඇතළත් කර තිබේ. ඒ අනුව මූලික අයිතිවාසිකම් රටින් රටට වෙනස් වීමට ඉඩතිබේ. සමහර රටවල් සිය සාමාජීය, සංස්කෘතික සහ ආර්ථික අයිතිවාසිකම්වලට මූලිකත්වය ලබා දී ඇත.

## මූලික අයිතිවාසිකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

මේ අනුව සංවර්ධිත රාජ්‍යයක් වූ මහා බ්‍රිතාන්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ මූලික අයිතිවාසිකම් පිළිබඳ වර්තමාන තත්ත්වය විමසා බැලීම වැදගත් වේ. එංගලන්තය, ස්කොට්ලන්තය, වේල්සය සහ උතුරු අයර්ලන්තය යන ප්‍රදේශවලින් සමන්විත වර්ග කිලෝමීටර් 3,15,093 ක් පුරා පැතිරී පවතින මහා බ්‍රිතාන්‍යයේ ජනගහනය 1,609,500 කි. දූපත් රාජ්‍යයක් වූ බ්‍රිතාන්‍යය "හිරු නොබසින අධිරාජ්‍ය" නමින් විරුදාවලිය ලත් රාජ්‍යයකි. එයට ප්‍රධාන හේතුව වූයේ ලෝකය පුරාම සිය යටත් විජිත ආධිපත්‍යය පතුරුවාලීමයි.බ්‍රිතාන්‍යය යනු ප්‍රජාතන්ත්‍රවදීත්වයෙන් පෝෂණය වූ රාජ්‍යයක් ලෙස හඳුනාගත හැක. නමුත් නියම ප්‍රජාතන්ත්‍රවාදයකට පිවිසීම සඳහා මහා බ්‍රිතාන්‍යයට මහත් වෑයමක් දරන්නට විය. මුල් අවධියේ බ්‍රිතාන්‍යයේ පැවතියේ ඒකාධිපති රාජාණ්ඩුවකි. ඒකාධිපති පාලනයෙන් පීඩාවට පත්ව සිටි ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ඉල්ලා උද්ඝෝෂණවල නියැලෙන්නට විය. මෙම ඓතිහාසික දේශපාලන පරිණාමය තුළ සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස 1215 ජූනි මාසයේ අත්සන් කරන ලද සුප්‍රකට'' මැග්නාකාර්ටා'' හෙවත් මහාධිකාර ගිවිසුම හඳුන්වා දිය හැකිය. ඒ සඳහා කරන ලද සටන්වලට වසර 750 කට වැඩි ඉතිහාසයක් ඇත. මහා බ්‍රිතාන්‍යයේ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස් උරුමයන් මුලින්ම තහවුරු වූයේද මෙම ගිවිසුම හරහාය. මෙම ගිවිසුම බ්‍රිතාන්‍යය නීතියේත්, ප්‍රජාතන්ත්‍රවාදී සංස්ථාවෙහිත් විශේෂ තැනක් ගනී. ක්‍රි.ව. 1199-1216 දක්වා රජකළ පළමුවන ජෝන් රජු අත්තනෝමතිකව පාලන කටයුතු මෙහෙය වූ අතරම කෲරතම පාලකයා ද විය. රටවැසියන් තමන්ගේ වහලුන් ලෙස සැලකූ රජු රටවැසියන්ගේ අයිතිවාසිකම් දෙස බැලුවේ අවඥා සහගතව ය. මෙම තත්ත්වය දරා ගැනීමට නොහැකි වූ බ්‍රිතාන්‍යය වැසියන් සන්නද්ධව පැමිණ ව්‍යවස්ථානුකූල පාලනයක් පෙන්වා දෙමින් ඊට අනුකූලව රාජ්‍ය පාලනය කිරීමට රජුට බලකළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 1215 ජූනි 15 දින මැග්නාකාර්ටා හෙවත් මහා අධිකාරී ගිවිසුමට (Magnacarta Great Charter) රජු අත්සන් තැබීය. මෙම ගිවිසුම හරහා නීතියට අනුව රාජ්‍ය පාලනය වූ අතර රටවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාවීමත්, ඔවුන්ට කෲර අන්දමින් සැලකීමත් වැළකී ගියහ.මෙම ගිවිසුම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස පෙන්වා දිය හැක.

එමෙන්ම 1679 පනවන ලද හබයාස් කෝපුස් ආඥාව ද බ්‍රිතාන්‍යය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට මඟපෙන්වන ලද්දකි. මෙම ආඥාව හරහා බ්‍රිතාන්‍යය වැසියන්ට සිය අදහස් පළකිරීමට සහ තොරතුරු ලබාගැනීමට අයිතිය හිමි වූ අතර අත්අඩංගුවට පත් අයෙකුට අධිකරණය ඉදිරියේ කායිකව පෙනී සිටීමට සහ අදහස් ප්‍රකාශ කිරීමට අයිතිය තහවුරු විය. මේ හරහා පාර්ලිමේන්තු බලය වර්ධනය වූ අතර ස්ටුවර්ට් පාලන කාලය තුළ ස්ටුවර්ට් වංශික දෙවන ජේම්ස් රජු විප්ලවයක් හරහා බලයෙන් පහකරන ලදී. 1688 "උත්කෘෂ්ඨ විප්ලවය" නමින්ද හඳුන්වන ලද්දේ මෙම විප්ලවයයි. මෙහි අවසන් ප්‍රතිඵලය වූයේ ජනතාවගේ නිදහස් අදහස් ප්‍රකාශනයට වඩාත් ඉඩකඩ ලැබෙන අයිතිවාසිකම් පනත සම්මත වීමයි. 1689 පෙබරවාරි බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව එහි දෙවන සැසිවාරයේදී

අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයක් ව්‍යවස්ථා පනතකට ඇතුලත්කර එයට නීතිමය පිළිගැනීමක් ලබාදෙන ලදී. මෙම පනත මඟින් පාර්ලිමේන්තුව උත්තරීතර ආයතනයක් ලෙස පිළිගැණුනු අතර ජනතාවගේ බදු අය කිරීම, බදු අහෝසි කිරීම, අයිතිවාසිකම් ආරක්‍ෂාවීම සිදුවිය. එමෙන්ම සර්වජන ඡන්දය පදනම් කරගනිමින් සාමාජිකයන් තෝරාගැනීම, දේශපාලන පක්ෂ ක්‍රමයක් වර්ධනයවීම වැනි ධනාත්මක ලක්ෂණ බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය තුළ ස්ථාපිත විය.

මෙහි පවතින සුවිශේෂී ලක්ෂණය වන්නේ බ්‍රිතාන්‍යය මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත්ව නොතිබීමය. එහෙත් බ්‍රිතාන්‍ය මූලික අයිතිවාසිකම් ආරක්‍ෂා කරන රාජ්‍යයක් ලෙස ප්‍රකට ය. මේ සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විශේෂඥයෙකු වූ අයිවර් ජෙනිග්ස් කළ ප්‍රකාශය වැදගත් ය. ''බ්‍රිතාන්‍යය අපට මූලික අයිතිවාසිකම් පිළිබඳ පනතක් නැත. රටේ සාමාන්‍ය නීතියට අනුකූලව භුක්ති විඳිය හැකි නිදහස පමණක් තිබේ. එසේ වුවද අප රටේ මූලික අයිතිවාසිකම් සාමාන්‍ය නීතිය බ්‍රිතාන්‍ය ජනතාවගේ මූලික අයිතිවාසිකම් ඉතා පුළුල් ලෙස සහතික කර ඇත''(ජයකුමාර්, 2006). නමුත් මහා බ්‍රිතාන්‍යය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ මූලික අයිතිවාසිකම් පිළිබඳ වර්තමාන තත්ත්වය සළකා බැලීමේදී ඉහත ප්‍රකාශ කළ අන්දමට මහා බ්‍රිතාන්‍යය තුළ මූලික අයිතිවාසිකම් සාමාන්‍ය නීතිය හරහා සහතිකකර ඇත් ද යන්න විමසා බැලිය යුතු ය. මහා බ්‍රිතාන්‍යයේ පුරවැසියන්ට හිමි මූලික අයිතිවාසිකම් මෙසේ සඳහන් කළහැක. සිතීමේ, හෘදසාක්ෂියේ හා ආගමික නිදහස භුක්ති විඳීමේ අයිතිය, නිදහස් මතය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය, සාමකාමීව එක්රැස් වීමේ සහ සංගම් පැවැත්වීමේ අයිතිය, දේපළ පිළිබඳ අයිතිය, ජීවත්වීමට ඇති අයිතිය, කිසිවෙක් වහල් භාවයේ නොයෙදීම සහ ශ්‍රම සූරාකෑමෙන් වැළකීමේ අයිතිය, වධහිංසාවලට හෝ කෲර අමානුෂික සහ ශ්‍රම සූරාකෑමෙන් වැළකීමේ අයිතිය, විවාහවීමට සහ නිදහස් පවුල් ජීවිතයක් ගතකිරීමට ඇති අයිතිය, පුද්ගලිකත්වයට ගරුකිරීමේ අයිතිය, නීතිය ඉදිරියේ සමානාත්මතාවය සඳහා ඇති අයිතිය, සාධාරණ හා අපක්ෂපාතී නඩු විභාගයකට ඇති අයිතිය, අසාධාරණයට ලක් කිරීමෙන් වැළකීමට ඇති අයිති ය.

මේ ආකාරයට මූලික අයිතිවාසිකම් ගණනාවක් බ්‍රිතාන්‍ය පුරවැසියා සතුවන නමුත් මෙම අයිතිවාසිකම් පිළිබඳ වර්තමාන තත්ත්වය විමසා බැලීමේදී එම අයිතිවාසිකම් යම් යම් තත්ත්ව මත සීමාවකට ලක්ව තිබේ. මෙහිදී බ්‍රිතාන්‍ය වැසියන්ට සිතීමේ, හෘදසාක්ෂියේ හා ආගමික නිදහස භුක්ති විඳීමේ අයිතිය හිමිවන අතර ඒ යටතේ තමන් කැමති ආගමක්, වන්දනාමාන පිළිවෙත් අනුගමනය කිරීමට පූර්ණ අයිතියක් හිමි වේ. නමුත් බ්‍රිතාන්‍ය පොදු නීතිය යටතේ සමාජයට හානිදායක වන අන්දමේ වන්දනාමානවල නියැලීම තහනම් වන අතර එවැනි තත්ත්වයක් තුළදී දඬුවම් ලබාදීම සිදුවේ. මෙයට උදාහරණ ලෙස යුරෝපියානු රටවල් පුරා පැතිරී යන යක්‍ෂ වන්දනාව පෙන්වා දියහැක. මෙහිදී අයිතිවාසිකම් භුක්ති විඳීමේ හැකියාවක් ඕනෑම පුද්ගලයෙකුට තිබූ පමණින්ම එම අයිතිවාසිකම හරහා අන් අයගේ අයිතිවාසිකම් උල්ලංඝණය නොවියයුතු අතර කිසිදු හානියක් නොවිය යුතුය. එය බ්‍රිතාන්‍යය තුළ දැකගත හැකි සුවිශේෂී ලක්ෂණයකි.

අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය සලකා බැලූ විට පාර්ලිමේන්තු ප්‍රකාශන සම්පූර්ණයෙන්ම මාධ්‍ය තුළින් ප්‍රකාශයට පත්කිරීමේ නිදහස ලබාදී ඇති අතර අධිකරණ ප්‍රකාශන යම්තාක් දුරකට වාරණයට ලක්වී ප්‍රකාශනය සඳහා ඉඩ ලබාදී ඇත. නමුත් මෙම අයිතිවාසිකම පොදු සුභ සාධනය, අධිකරණය සඳහා ඇති ගරුත්වය, ජනමාධ්‍ය නියාමනය කිරීම, ජාතික ආරක්ෂාව සහ රහස්‍යභාවය වැනි කාරණා යටතේ යම් සීමා කිරීමකට ලක්ව ඇත.

සාමකාමීව රැස්වීමේ සහ සංගම් පැවැත්වීමේ අයිතිය යටතේ නිදහස භුක්තිවිඳීමට බ්‍රිතාන්‍යය වැසියන්ට හිමිව පැවතියද පොදු නීතිය යටතේ පවතින "රැජිනගේ සාමය ආරක්ෂාකිරීම යන රාජ්‍ය (Queen Peace) අධිකාරීත්වය යටතේ මෙම අයිතිවාසිකම දැඩිලෙස සීමාවට ලක්ව ඇත" (http://www.theguardian.com/law/2013/may/31/uk-human-rights-record-un-panel). මහා බ්‍රිතාන්‍යය තුළ ඕනෑම රැස්වීමක් අවලංගු කිරීමේ හැකියාව මේ යටතේ හිමිව ඇත. 2011 වර්ෂයේ ප්‍රථමවරට අභියාචනාධිකරණයක් මඟින් වැඩ වර්ජනය කිරීමේ අයිතිය පිළිගෙන ඇති නමුත් 2000 වසරේදී ගෙන එන ලද ත්‍රස්තවාදී පනත යටතේ මෙය සීමා කර තිබේ. එමෙන්ම 1986 මහජන විනය පිළිබඳ පනත හරහා කැරලි ගැසීම්, කැළඹීම්, බලහත්කාරකම් මඟින් පීඩිත තත්ත්වයන් රට තුළ ඇති කරයි නම් එය වැළැක්වීමට මෙම පනත යටතේ අවසර ලබා දී ඇත. එම නිසා මෙම අයිතිවාසිකම ද සීමාවට ලක්ව තිබේ.

"පුද්ගලිකත්වයට ගරු කිරීමේ අයිතිය යටතේ ගෙනඑන ලද 1998 දත්ත ආරක්ෂක පනත (Data Protection Act) මඟින් පුද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම යම්තාක් දුරකට සිදු වේ"(http://en.wikipedia.org/wiki/Human-rights-in-the-United-Kingdom). නමුත් මෙම නිදහස 1989 ආරක්ෂක සේවා පනත යටතේ මෙන්ම 1994 බුද්ධිමය සේවා පනත යටතේ සීමාසහිත කරඇත. විවාහ වීමට ඇති නිදහස සහ පවුල් ජීවිතයක් ගතකිරීමට ඇති අයිතිය යටතේ බ්‍රිතාන්‍යය වැසියන් උපරිම නිදහසක් භුක්ති විඳිනු ලබයි. 1949 විවාහ පනත මඟින් අවුරුදු 18 ට වැඩි පුද්ගලයින් අතර සිදු කෙරෙන විවාහයන් පමණක් අනුමත කර ඇත. එමෙන්ම ''2013 ගෙන එන ලද විවාහ පනත යටතේ සමලිංගික විවාහ සඳහා අවසර ලබා දී ඇත''(http://en.wikipedia.org/wiki/Human-rights-in-the-United-Kingdom). මෙමඟින් පැහැදිලි වන්නේ බ්‍රිතාන්‍යය පුරවැසියන් හට සිය විවාහ ජීවිතය සහ පවුල් ජීවිතය සඳහා අයිතිය තුළ සමලිංගිකයින්ට ඉඩ ප්‍රස්ථාව සලසා ඇති ආකාරයි. නමුත් ලෝකයේ බොහෝමයක් රටවල සමලිංගික විවාහ ප්‍රතික්ෂේප කරනු ලබයි.

වධහිංසාවට හෝ කෲර අමානුෂික දඬුවමට ලක් නොවීමේ අයිතිය බ්‍රිතාන්‍ය වැසියන් පොදු නීතිය යටතේ භුක්ති විඳිනු ලබයි. 2004 වර්ෂයේදී ගෙන එන ලද ළමා පනත මඟින් දරුවන්ට පාසල තුළ දඬුවම් කිරීමට තිබූ ලිහිල් නීතිය මේ යටතේ ඉවත් කරන ලදී. මෙහිදී 2004 වර්ෂයට පෙර බොහෝ දරුවන් පාසල තුළ දරුණු සහ අසාමාන්‍ය වධ බන්ධනවලට ලක් වී තිබේ. එමෙන්ම බ්‍රිතාන්‍යය වැසියන් රාජ්‍යය පාලන සමයේ සිටම 1689 අයිතිවාසිකම්

පනත තහවුරු වන වකවානුව දක්වාම කෲර අමානුෂික දඬුවම්වලට ලක්ව ඇත. 1689 අයිතිවාසිකම් පනත සම්මතවීමේ සිට වර්තමානය දක්වාම මෙම අයිතිවාසිකම ක්‍රියාත්මක වුවද බොහෝ විට බ්‍රිතාන්‍යය වැසියන් වැඩ වර්ජන, පාගමන් වැනි අවස්ථාවලදී කෲර අමානුෂික වධ බන්ධනවලට ලක්වන බව වාර්තා වී තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හා මූලික අයිතිවාසිකම් පිළිබඳ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමේදී සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයක් ලෙස දකුණු අප්‍රිකානු රාජ්‍යයක් වූ ටැන්සානියානු රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ මූලික අයිතිවාසිකම් පිළිබඳ වර්තමාන තත්ත්වය විමසා බැලීමට පෙර ටැන්සානියානු රාජ්‍යය සම්බන්ධයෙන් විමසා බැලිය යුතු වේ. ටැන්සානියාව නැගෙනහිර අප්‍රිකානු රාජ්‍යයක් වූ අතර නැගෙනහිර අප්‍රිකාව කෙරෙහි මහා බ්‍රිතාන්‍යය සිය අවධානය යොමුකළ අතර ඇත්දළ සහ වහල් වෙළඳාම ප්‍රධාන කරගත් වාණිජ ආධිපත්‍යයක් පතුරුවාලීම ප්‍රධාන අරමුණ වූහ. නමුත් දේශපාලනික වශයෙන්ද බලය පතුරුවාලීමට කටයුතු කළ බ්‍රිතාන්‍යයන් අප්‍රිකාවේ ස්වදේශිකයන් අතර භේද වපුරා ඔවුනොවුන් ගැටීමට සලස්වා අසමගි කර තමන්ට එරෙහිව ඒකරාශිවීම වළක්වා ගත්හ. නමුත් ක්‍රි.ව.1891-1899 අතර කාලපරිච්ඡේදය තුළ අප්‍රිකානු රාජ්‍යක් වූ බුන්යෝරෝව පාලනය කළ කබරගා රජුත් ලුගාඩය සහ බ්‍රිතාන්‍ය ජාතිකයන් අතරත් ගැටුම් ඇති විය. දිගින් දිගටම බ්‍රිතාන්‍යය ආධිපත්‍යයට එරෙහිව කටයුතු කළේ ය. මෙලෙස නිර්මාණය වූ ටැන්සානියාවේමූලික අයිතිවාසිකම් පිළිබඳ වර්තමාන තත්ත්වය විමසාබැලීමේදී නීතිය ඉදිරියේ සමානාත්මතාවය, ජීවත්වීමේ අයිතිය, පුද්ගලික නිදහස සඳහා ඇති අයිතිය, පුද්ගලික රහස්‍යභාවයට සහ පුද්ගලික ආරක්ෂාව සඳහා ඇති අයිතිය, නිදහසේ එහා මෙහා යාමේ අයිතිය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය,කැමති ආගමක් ඇදහීම සඳහා ඇති අයිතිය, එක්රැස් වීමේ සහ සංගම් පැවැත්වීමේ අයිතිය,පොදු කටයුතුවලට සහභාගීවීම සඳහා ඇති අයිතිය, රැකියාවක නිරතවීම සඳහා ඇති අයිතිය,සාධාරණ වැටුපක් සඳහා ඇති අයිතිය, පෞද්ගලික දේපළ සඳහා ඇති අයිතිය. ආදී වශයෙන් මූලික අයිතිවාසිකම් ගණනාවකි.

ටැන්සානියා රාජ්‍යය තුළ කාන්තාවන් දැඩි ලෙස හිංසනයට ලක්වීමේ වැඩි ප්‍රවණතාවයක් දැකගත හැකිය. 1998 හඳුන්වා දුන් කාන්තා සුන්නත්කරණය හෙවත් කාන්තාවන්ගේ ලිංගික අවයව ඉවත් කිරීමට එරෙහි අපරාධ නීතිය පැවතියද ටැන්සානියවේ බොහෝ ප්‍රදේශවල කාන්තාවන් සුන්නත් කිරීමේ කාර්ය දිගටම කරගෙන යන ලදී. මෙම තත්ත්වය මත බොහෝදුරට ටැන්සානියාව තුළ කාන්තාවන් හිංසාවට මෙන්ම මරණයට පත්වීමේ නව ප්‍රවනතාවයක් දක්නට ලැබේ. අවුරුදු 18 වඩා අඩු ගැහැණු ළමයින්ව සුන්නත් කිරීමේ කාර්ය සිදුකරන ලද පුද්ගලයා අවුරුදු 15ක් දක්වා සිරගත කරන ලදී. මේ සම්බන්ධයෙන් දැනුවත්කිරීම් දිගින් දිගටම රාජ්‍ය නොවන සංවිධාන මඟින් ක්‍රියාත්මක කළද ටැන්සානියාවේ කාන්තාවන් සුන්නත් කිරීමට විරුද්ධව කිසිදු පැමිණිල්ලක් නොලැබුණි. එමෙන්ම ටැන්සානියාව තුළ එනම් 2005 වර්ෂයේදී යක් දෙස්සියන් හෙවත් මායාකාරියන් ලෙස සලකමින් වැඩිහිටි කාන්තාවන් ඝාතනයට ලක් කිරීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබුණි.

''2005 වර්ෂයේ අගෝස්තු මාසයේ දී එරින්ගා (Eranga)නමින් හැඳින්වූ දිස්ත්‍රික්කය තුළ එසේ වැඩිහිටි කාන්තාවන් ඝාතනය කිරීම සම්බන්ධයෙන් විත්තිකරුවන් වූ පුද්ගලයන් 20 දෙනෙකු අත්අඩංගු ගෙන ඇති අතර, ඒ අතර ප්‍රාදේශීය නායකයන්ද විය''(http://web.amnesty.org/report2005/tza-summary-eng). මේ ආකාරයට ඉතා ප්‍රචණ්ඩකාරී සහ හිංසාකාරී අන්දමට කාන්තාවන් දැඩි ලෙස හිංසනයට ලක්වීම ටැන්සානියාව තුළ දැකගත හැකි වේ.

18 වන වගන්තිය යටතේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය පුරවැසියන්ට හිමිවී පැවතිය ද සැන්සිබාර් රජය යටතේ විරුද්ධ පක්ෂ ක්‍රියාකාරීන්, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික ජනමාධ්‍යන්හි ක්‍රියාකාරකම් සැන්සිබාරය තුළ සීමා කිරීමකට ලක්කර තිබුණි. එමෙන්ම ''2003 වසරේදී බල ගන්වන ලද මාධ්‍ය නියාමන පනත ජාතික සහ ජාත්‍යන්තර මාධ්‍ය කණ්ඩායම් විසින් ප්‍රතික්ෂේප කරන ලදී'' (http://web.amnesty.org/report 2005/tza-summary-eng). එයට හේතුව වූයේ මාධ්‍ය නිදහස ප්‍රමානවත් පරිදි රැකගැනීමට හැකියාවක් නොතිබුනු බැවිනි. 2004 වන විට ටැන්සානියාවේ මුද්‍රිත මාධ්‍ය නිදහස යම්කිසි යහපත් තත්ත්වයක පැවතියද අර්ධ ස්වාධීන පාලන දූපත් සමූහයක් වන සැන්සිබාර් රාජ්‍යයේ බලපෑම තවදුරටත් ක්‍රියාත්මක විනි. සැන්සිබාරයේ දේශපාලඥයන් විසින් ඔවුන්ට වුවමනා ආකාරයට හේතුන් රහිතව මාධ්‍යයන්ට බලපෑම් කිරීම ක්‍රියාවට නංවන ලදී. දිනපතා පුවත්පත් 11 ක සහ සතිපතා පුවත්පත් 59 ඇතුළුව පුවත්පත් 400 කට වඩා වැඩි ප්‍රමාණයක් ටැන්සානියාවේ තොරතුරු සේවයේ ලියාපදිංචි වී ඇත. ගුවන් විදුලි සේවා 30 ක්ද රූපවාහිනී සේවා 20 ක්ද මීට ඇතුළත් වේ. මාධ්‍ය පිළිබඳ අවධානයෙන් සිටින කණ්ඩායම් ලෝක මාධ්‍ය දිනය වන මැයි 03 වනදා නව මාධ්‍ය නීතියක් සම්පාදනය කරන ලෙස ආණ්ඩුවට බලකරන ලදී. ''සති කීපයකින් පසුව තොරතුරු අමාත්‍යවරයා වූ මොහොමඩ් සයිෆ් කතිබ් (Mohomad Seif Khatib) පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කර සිටියේ දැනට පවතින නීතිය යටතේ විද්‍යුත් මාධ්‍යයන්වලට රටෙන් 1/4 කට වඩා වැඩි ප්‍රමාණයක් අනාවරණය කිරීමට ඉඩ ලබා නොදෙන නිසා එම නීතිය යල් පැනගිය නීතියක් බවයි'' (http://web.amnesty.org/report2005/tza-summary-eng).මුද්‍රිත මාධ්‍ය නිදහස පිළිබඳව තවදුරටත් සාකච්ඡා කිරීමේදී ප්‍රාදේශීය බලධාරීන් විසින් නිදහස් මාධ්‍යවලට තවදුරටත් බලපෑම් කරන ලදී. සතිපතා පුවත්පතක් වන ඩීරා (Dira) නිරන්තරයෙන්ම ප්‍රහාරයන්ට ලක් වුනු අතර එහි සංස්කාරකවරයාද විවිධ වධහිංසාවලට ලක් වී ඇත. T.V.T. (Televisheniya Taifa) වානිජ රූපවාහිනී සේවයක් වන අතර එහි මාධ්‍යවේදියෙකු ලෙස කටයුතු කළ ප්‍රැක්සෙඩා මතිනා (Praxeda Matina) 2003 නොවැම්බර් 14 දින ටැන්සානියාවේ නැගෙනහිර ප්‍රදේශයේ දිස්ත්‍රික්කයක් වූ කිලොම්බරෝ (Kilombero) පොලිස් මූලස්ථානයේ පැය ගණනාවක් රඳවා ගන්නා ලදී.එයට හේතුව වුයේ ඔහු සීනි කර්මාන්තයක් සඳහා ඉඩම් ලබාගැනීමට, එහි වැසියන්ගේ ඉඩම් පැහැර ගැනීම්වලට ලක් වන බව වාර්තා කිරීම හේතුවෙනි. මෙහිදී දේශීය බලධාරීන් විසින් මාධ්‍ය මගින් එම භූමිවල පදිංචි පුද්ගලයන් එලවාදැමීම වාර්තාකිරීම තහනම් කරන ලදී.

ඉන්දියාව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙස හඳුනා ගතහැක. එමෙන්ම දකුණු ආසියාවේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මය මුල්බැසගත් ශක්තිමත්ම රාජ්‍යයඉන්දියාව වූහ. ජනගහනය අතින් ලෝකයේ දෙවෙනි රටවන ඉන්දියාව ලොව විශාලතම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය වේ. 1950 දශකය ආරම්භයේ සිටම ලෝකයේ රටවල් අතර පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ස්ථාවර වූ රාජ්‍යය වශයෙන් ඉන්දියාව හඳුනාගත හැකි වේ. මෙම පසුබිම නිසාම ඉන්දියාව ආසියවේ නිදහස ලැබූ රටවල් අතුරින් සාමාජීය හා දේශපාලන වශයෙන් බොහෝ නවීකරණය වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා තේරීම් කමිටුවක් පත්කළ අතර එහි සභාපතිවරයා වූ ආචාර්ය බිම්රාඕ රාම්ජී අම්බෙඩ්කාර්ගේ මඟ පෙන්වීම යටතේ 1949 නොවැම්බර් 04 වන දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ඉදිරිපත් කරන ලදී. මෙම ව්‍යවස්ථා කෙටුම්පත සඳහා අවසාන අනුමැතිය ලැබීමෙන් පසු 1950 ජනවාරි 26 වන දින ඉන්දියාවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය විය.

නමුත් ඉන්දියානු සමාජයේ පැවති ජනවාර්ගික, ආගමික, භාෂා, කුල ගෝත්‍ර සහ පන්ති වශයෙන් පැවති දැඩි සංකීර්ණ ස්වභාවය ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව සම්පාදනය කිරීමේදී දැඩි ලෙස බලපෑම් කරන ලදී. මෙම සංකීර්ණතාවය විසඳාලමින් සියලු ඉන්දියානුවන්ගේ නිදහස සහ සමානාත්මතාවය ආරක්ෂා කරලීම සඳහා ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළට මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් අන්තර්ගත කරන ලදී. මෙසේ අන්තර්ගත කරන ලද මූලික අයිතිවාසිකම් ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි තුන්වන පරිච්ඡේදයේ 12 වගන්තියේ සිට 35 වන වගන්තිය දක්වා සඳහන් කර ඇති අතර ''ඉන්දියානු ව්‍යවස්ථාවේ සඳහන් වන මූලික අයිතිවාසිකම් හඳුන්වනු ලබන්නේ ඉන්දියාවේ මැග්නාකාර්ටා (Magnacarta of India) ලෙසය" (http://en.wikipedia.org/wiki/Fundamental-Rights-in-India). නීතිය ඉදිරියේ සමානාත්මතාවය, රජය මඟින් කිසිම පුරවැසියෙකු ආගම, ජාතිය, වර්ණය, කුලය, ලිංගිකත්වය හෝ උපන් ස්ථානය අනුව අසාධාරණයට ලක්නොවීම, රජයේ රැකියාවලදී සමාන අවස්ථා ලබාදීම, පහත් යැයි සම්මත කුලවලට අයත් පුද්ගලයන්ට නොසලකා හැරීම සහ එය ක්‍රියාත්මකකිරීම ඉවත්කිරීම, අධ්‍යාපනික සහ හමුදාමය පදවිනාම හැර අනෙකුත් පදවිනාම අවලංගුකිරීම, නිදහස සඳහා ඇති අයිතිය, අත්තනෝමතිකව අධික දඬුවම් ලබාදීමට විරුද්ධවීමේ අයිතිය,පෞද්ගලික නිදහස අහිමි නොකිරීමේ අයිතිය ආදී වශයෙන් ඉන්දියානු ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් අන්තර්ගත වේ.

ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අන්තර්ගත මූලික අයිතිවාසිකම්වල වර්තමාන තත්ත්වය විමසා බැලීමේදී ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන වගන්තිය යටතේ නීතිය මඟින් හැරුණු කොට වෙන යම් ආකාරයකින් පුද්ගලයෙකුගේ ජීවත්වීම සඳහා වූ අයිතිය සහ පෞද්ගලික නිදහස අවහිර කළ නොහැක. එමඟින් අදහස් කෙරෙනුයේ පුද්ගලයෙකුගේ ජීවත්වීමේ නිදහස සහ පුද්ගලික නිදහස අවහිර කළහැක්කේ එම පුද්ගලයා අපරාධයක් සිදුකර ඇත්නම් පමණි. කෙසේ නමුත් ජීවත්වීම සඳහා වූ අයිතියෙහි මරණය

සඳහා වූ අයිතිය අඩංගු නොවේ. එම නිසා සියදිවි හානිකර ගැනීම හෝ සියදිවි හානිකර ගැනීමට තැත්කිරීම අපරාධයක් ලෙස සැලකේ. ඉන්දියානු ආරක්ෂක නීති සංග්‍රහයේ 309 කොටස සියදිවි නසා ගැනීමට තැත්කිරීම වසරක් දක්වා දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස 1994 දී ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් පනවන ලදී. නමුත් 1996 දී මෙය ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් අහෝසි කළේය.

නිදහස සඳහා ඇති අයිතිය යටතේ 2002 වර්ෂයේ 86 සංශෝධන පනත යටතේ 21A වගන්තිය යටතේ ප්‍රාථමික අධ්‍යාපනයට ඇති අයිතිය, නිදහස සඳහා ඇති අයිතියේ කොටසක් ලෙස ඇතුළත් කරන ලදී. මෙමඟින් අනිවාර්ය සහ නිදහස් අධ්‍යාපනය ඉන්දියාවේ වයස අවුරුදු 06 සිට වයස අවුරුදු 16 දක්වා දරුවන්ට ලබාදිය යුතුබව ප්‍රකාශ කෙරිණි. නමුත් ලංකාව තුළ මෙම තත්ත්වය හා සසඳා බැලීමේ දී වයස අවුරුදු 06 සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දීම සිදුවේ. නමුත් ඉන්දියාවේ වයස අවුරුදු 14 දක්වා පමණක් නිදහස් අධ්‍යාපනය ලබා දීම සිදු වේ. නමුත් 2008 දී අධ්‍යාපනය සඳහා ඇති අයිතිය, නිදහස සඳහා ඇති අයිතිවාසිකම් යටතේ ඉන්දියානු කැබිනට් මණ්ඩලය මඟින් ඉවත්කරන ලදී.

සූරාකෑම්වලට විරුද්ධව ඇති අයිතිවාසිකම ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 23 සහ 24 වෙනි වගන්ති යටතේ අවධාරණය කෙරේ. මෙම අයිතිවාසිකම විධි විධාන දෙකක් යටතේ දක්වේ. එනම් මිනිස් ජාවාරම අහෝසි කිරීම සහ බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය අහෝසි කිරීමත් වයස අවුරුදු 14 ට වඩා අඩු දරුවන් රැකියාවල යෙදවීම සහ අනතුරුදායක රැකියා එනම් කර්මාන්තශාලා, පතල් වැඩකිරීම වැනි භයානක වෘත්තීන් වල යෙදවීම තහනම් කිරීමයි. මෙහිදී ළමා ශ්‍රමය යොදා ගැනීම ඉන්දියානු ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක් ලෙස සැලකේ. නමුත් ඉන්දියාවේ වයස අවුරුදු 14 ට වඩා අඩු ළමයින් මිලියන 16.5 ප්‍රමාණයක් ඉන්දියාව තුළ රැකියාවල නිරත වේ. ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය තුළ මෙම වගන්තිය කඩකිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක් ලෙස සැලකුවද ඊට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු නොලබයි.

එමෙන්ම ඉන්දියාව තුළ කාන්තාවන්ට හිමි වන අයිතිවාසිකම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී බොහෝදුරට එම අයිතිවාසිකම් කාන්තාවන්ට හිමිනොවන තත්ත්වයක් හඳුනාගත හැකිය. ඉන්දියාව තුළ පවතින්නා වූ විවිධ සංස්කෘතීන්වල බලපෑම මත ඉන්දීය කාන්තාව දැඩි ලෙස හිංසනයට සහ දූෂණයට ලක්වන අවස්ථා එමටය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් තුළ කාන්තාවන් පිළිබඳව සඳහන් වුවද, විශේෂයෙන් ගැහැණු දරුවන් උපතේදීම ගෙල මිරිකා මරාදැමීම දක්නට ලැබේ. ඉන්දියාවේ වසරකට ලක්ෂ 10 ක ගැහැණු කළල විනාශ කිරීම සිදු වේ. එමෙන්ම ''සති පූජාව නම් චාරිත්‍රයක් ඇති කොට ඇයට සැමියාගේ දර සෑයට පැන මියයාමට නියම කරයි'' (http://www.silumina.lk).

1980 දී ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අධ්‍යාපන මට්ටම කාර්යක්ෂම කිරීම සඳහා රජයකට පියවර ගතහැකි බව තහවුරු කරන ලදී. එමෙන්ම 21 වෙනි වගන්තියේ A කොටස

යටතේ පැවති අධ්‍යාපන අයිතිවාසිකම පිළිබඳව 2010 අප්‍රේල් 01 දින ඓතිහාසික නීතියක් අන්තර්ගත කරන ලදී. එනම් සෑම දරුවෙකුගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගන්නා ලදී. මෙහිදී ''නිදහස සහ අනිවාර්ය අධ්‍යාපනය සඳහා ළමුන්ට ඇති අයිතිය පිළිබඳ පනත (Right to Children to Free and Compulsory Education Act) මගින් වයස අවුරුදු 6-14 ළමුන් සඳහා අධ්‍යාපනය ලබාදීම අනිවාර්ය වූ අතර පෞද්ගලික අධ්‍යාපනික ආයතනවල ළමුන් සංඛ්‍යාවෙන් 25% සමාජයේ දුර්වල කොටස් සඳහා වෙන්කළනමුත් ඉන්දියාව තුළ ජීවත්වන ඇතැම් පහත් යැයි සම්මත කුලවල දරුවන්ට සමහර විශ්ව විද්‍යාලවලට ඇතුළත්වීම සඳහා අවශ්‍ය කඩඉම් ලකුණු සම්පූර්ණ කළද ''විශ්ව විද්‍යාල වලට ඇතුළත් කරගන්නා ප්‍රමාණය 80% බ්‍රාහ්මණ කුල දරුවන්ට වෙන්ව පවතින අතර එයින් 20% පමණ සුළුතරයකට පමණක් කුලහීන දරුවන්ට වෙන්ව පවතින ආකාරයක් දැකගත හැකි විය'' (http://www.facts-about-india.com/fundamental-rights-in-India.php).

**නිගමනය**

මේ අනුව බ්‍රිතාන්‍යය, ඉන්දියාව, ටැන්සානියාව රටවලමූලික අයිතිවාසිකම් පිළිබඳ ලේඛනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අන්තර්ගත වුවද, මූලික අයිතිවාසිකම් පිළිබඳ වර්තමාන තත්ත්වයවිමසා බැලීමේදී එම රටවල් බහුවාර්ගික, බහුආගමික හා බහුසංස්කෘතීන් පද්ධතියකින්සමන්විතවීමත්, ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය තුළ මූලික අයිතිවාසිකම් උල්ලංඝණයවීමත් හේතුකොට ගෙන මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අන්තර්ගත වූ පමණින්ම ඒවා ආරක්ෂා නොවන අතර ඒවා දැඩි ලෙස උල්ලංඝණය වන ආකාරයක් ඉහත සාධක හරහා දක්නට ලැබෙනබව අවසාන වශයෙන් නිගමනය කළහැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**

අබේසිංහ, ඩබ්ලිව්.ජ්. (1968), *බ්‍රිතාන්‍යය ආණ්ඩුක්‍රමය*, ඇස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

අලහකෝන්, එම්.ජේ. (2005), *දේශපාලන චින්තන සංග්‍රහය*, කතෘ ප්‍රකාශන, බාඳුරාගොඩ.

කරුණාදාස, ඩබ්ලිව්,එම්. (2006), *ජාත්‍යන්තර මානුෂික අයිතිවාසිකම් නීතිය,* ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ, දෙහිවල.

කරුණාදාස, ඩබ්ලිව්.එම්. (2001), *දකුණු ආසියාතික දේශපාලනය*, ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ, දෙහිවල.

කුරේ, ක්‍රිශාන්ත් නිරංජන් (2007), *මානව හිමිකම්*, ආශිර්වාද ප්‍රකාශකයෝ, මීරිගම.

ජයතිලක, ජී.ඩබ්ලිව්. (2002), *යුරෝපා ඉතිහාසය-නූතන යුගය (1500-1800 දක්වා),* ඇස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.

සෙනෙවිරත්න, චාමින්ද (2005), *අප්‍රිකා මහද්වීපය (රට රටවල තොරතුරු),* සූරිය ප්‍රකාශකයෝ, කොළඹ.

සොයිසා, එම්.ඕ.ඒ. ද (1993), *දේශපාලන විද්‍යාවේ මූලික සිද්ධාන්ත,* දේශපාලන විද්‍යා අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.

හිග්ගොඩ, යූ.බී. (1992), *දේශපාලන විද්‍යාව*, කොලිටි ප්‍රින්ටර්ස්, කෑගල්ල.

හෙට්ටිආරච්චි, නිශාන්ත (2011), *ඉන්දියාවේ ආණ්ඩුක්‍රමය සහ දේශපාලනය*, කතෘ ප්‍රකාශන, නුගේගොඩ.

http://en.wikipedia.org/wiki/Human-rights-in-the-United-Kingdom

http://www.equalityhumanrights.com/human-rights/what-are-human-rights/the-human-rights-act/

Civil liberty-http://en.wikipedia.org/wiki/Civil-liberties-in-the-United-Kingdom

http://en.wikipedia.org/wiki/Charter-of-Fundamental-Rights-of-the-European-Union

http://en.wikipedia.org/wiki/Human-rights-in-the-United-Kingdom

http://www.huffingtonpost.co.uk/2012/03/01/uk-undermining-gypsies-rights-n-1313021.html

http://en.wikipedia.org/wiki/Fundamental-Rights,-Directive-Principles-and-Fundamental-Duties-of-India